**ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය - 2022**

-----------------------------------------------------------------

ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය, නාවික හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

බස්නාහිර, වයඹ, මධ්‍යම, දකුණ සහ සබරගමුව පළාත්වල ජාතික මාර්ග කි.මී. 202 ක් වැඩිදියුණු කිරීමත්, පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සහ පුළුල් කිරීම මඟින් මාර්ග ජාල සම්බන්ධතා වැඩිදියුණු කර ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා පවතින ඉල්ලුම සම්පූර්ණ කිරීම සහ ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛ ස්ථානයක් ස්ථාපිත කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 7,121.32 කට සමාන වූ එජඩො මිලියන 62.46 ක් වන අතර ඉන් රු.මිලියන 4,560 කට සමාන වූ එජඩො මිලියන 40 ක් සැපයීම සඳහා අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු.මිලියන 2,561.32 කට සමාන වූ එජඩො මිලියන 22.46 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2013 ජනවාරි 16 දින ආරම්භ කරන ලද අතර, 2016 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2022 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත මාගේ මතය තත්ත්වාගණනය කරන ලදී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | මුදල රු.මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 5 හි 36 වගන්තිය අනුව, විදේශ විනිමය ලාභ හෝ අලාභ ශුද්ධ වත්කම් / හිමිකම් යටතේ හඳුනාගත යුතු නමුත් ව්‍යාපෘතිය විසින් ප්‍රමිතියේ මාර්ගෝපදේශ ප්‍රකාරව විනිමය ලාභ හෝ අලාභ හඳුනාගෙන නොතිබුණි. | - | 2014 වර්ෂයේ සිට 2016 දක්වා පැකේජ 07 සඳහා වියපැහැදම්, විදේශ විනිමය සහ දේශීය අරමුදල් මඟින් සමානුපාතිකව සිදු කර තිබුණි. විදේශ විනිමය ලාභ / අලාභ ජ'නල වවුචරවල වාර්තා කර ඇති අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ට පටහැනිව, ඉඩම් අත්පත්කර ගැනීමේදී ඉඩම් කැබලි 1,897 ක් සඳහා වන්දි ගෙවීම් සහ ඉඩම් කැබලි 2,585 ක් සඳහා ප්‍රමාද පොලී සඳහා 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන සිදු කර නොතිබුණි. | - | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් අදාළ තොරතුරු එකතු කර ඒ අනුව 2023 වර්ෂයේ වන්දි සහ පොලී සඳහා ප්‍රතිපාදන සිදු කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත විය යුතුය. |

### 2.2 නොසැසඳු ශේෂයන්

| මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.මිලියන | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. මිලියන | අනුරූපී වාර්තා විස්තරය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 4,754.48 | 4,748.59 | අතුරු ගෙවීම් සහතික පත් ලේඛණයේ සඳහන් පැකේජ 06 ක ඉදිකිරීම් පිරිවැය. | 2014 වර්ෂයේ සිට 2016 දක්වා පැකේජ 07 හි වියපැහැදම් විදේශ විනිමය සහ දේශීය අරමුදල් මඟින් සමානුපාතිකව සිදුවිය. වියපැහැදම් මඟින් පැනනැගුණු විදේශ විනිමය ලාභ/අලාභ ජ'නල් වවුචර්වල වාර්තා කළ අතර, මෙම ගැලපීම් කොන්ත්‍රාත් ලේඛණයේ වාර්තා නොකරන ලදී. | කොන්ත්‍රාත් ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

**2.3 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරික්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 753(3) | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නිලධාරීන්ට නිකුත් කරන ලද අයිතම තොග පොතේ ඇතුලත් කර නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂය අවසාන දිනට තොග පොත් ශේෂ කිරීමට නොහැකි වී තිබුණි. | නිලධාරීන්ට නිකුත් කරන ලද තොග අයිතම තොග ලේඛණයට ඇතුලත් කර ඇත. නමුත් ආරම්භක ශේෂය තොග ලේඛණයේ ඉදිරියට ගෙනවිත් පෙන්වා නොතිබුණි. 2023 වර්ෂයේ සිට ඒ අනුව අයිතම වාර්තා කිරීමට ක්‍රියා මාර්ග ගනු ලැබේ. | මුදල් රෙගුලාසිවලට අනුගත විය යුතුය. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක. 01/2019 දරණ කළමණාකරන සේවා චක්‍රලේඛය. 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතුය. නමුත් සමාලෝචිත වර්ෂය තුල එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | රටේ පැවති ආර්ථික අර්බුදය සහ ප්‍රවාහන ගැටළු හේතුවෙන් මෙහෙයුම් කමිටු රැස්වීම් සැලසුම් නොකරන ලදී. | චක්‍රලේඛ උපදෙස් වලට අනුගත විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය**

**(අ) ඉඩම් අත්පත් කර ගැනීම**

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | | කැබලි | කැබලි | | |
| ඉඩම් අත්පත් කර ගැනීම | මාර්ග සංවර්ධන අධිකාරියට හිමිකම් පැවරීම | 2772 | 146 | 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් කැබලි 730 ක් සඳහා රු. මිලියන 245.13 ක වන්දි සහ ඉඩම් කැබලි 155 ක් සඳහා ප්‍රමාද පොලී රු.මිලියන 22.86 ක් ගෙවා තිබුණි. තවද ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 උප වගන්තිය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් කැබලි 146 ක් පමණක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබුණි. | දුර්වල සුපරීක්ෂණය හේතුවෙන් ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු ප්‍රමාද වීම. |

**කළමනාකරණයේ අදහස් දැක්වීම** ඉඩම් අත්පත්කර ගැනීමේ පනතෙහි 44 වගන්තිය යටතේ අත්පත් කරගත් ඉඩම් ලියාපදිංචි කිරීම අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සිදු කරයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලියාපදිංචිය පිළිබඳ ප්‍රමාදයක් පවතින අතර, එම කටයුතු අවසන් කිරීමට සිහිකැඳවීම් කිහිපයක් යොමු කර ඇති අතර, කටයුතු සිදු කෙරෙමින් පවතී.

**විගණකගේ නිර්දේශයන්** අමතර පිරිවැය වළක්වා ගැනීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම් සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහයක් ගත යුතුය.

(ආ) සිවිල් වැඩ

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | 2022 දෙසැම්බර් 31 දිනට ළඟා කරගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශතය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| සිවිල් වැඩ | පාලම් පුළුල් කිරීම | 14 | 2 | සැලසුම් කල පරිදි කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාද වීම පාලම් අංක. 4/2 පුළුල් කිරීමේ දුර්වල ප්‍රගතිය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. | දුර්වල සුපරික්ෂණය සහ කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාද වීම. |

**කළමනාකරණයේ අදහස් දැක්වීම** 2021.10.23 දින ණය ප්‍රදානකරුගේ අනුමැතිය සඳහා එම ප්‍රසම්පාදන තීරණ යොමු කර ඇති අතර, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා එම ණය ප්‍රදානකරුගෙන් ඒ සඳහා පිළිතුරු 2022.03.14 දින ලැබී තිබුණි.

**විගණකගේ නිර්දේශයන්** අමතර පිරිවැයකින් තොරව ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල ප්‍රගතිය හේතුවෙන් රු.මිලියන 19.51 ක මුදලක් මිල විචලන වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට අතුරු ගෙවීම් සහතිකපත් මඟින් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. එය ව්‍යාපෘතියේ පිරිවැය ඉහල යාමට සෘජුවම බලපා තිබුණි. | කොන්ත්‍රාත් කොන්දේසි 13.8 වගන්තිය ප්‍රකාරව ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල උච්චාවචනයන් සඳහා මිල විචලනයන් ගෙවා තිබුණු අතර ව්‍යාපෘති ප්‍රගතිය හා එහි සම්බන්ධයක් නොමැත. | අමතර පිරිවැයකින් තොරව ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය. |
| (ආ) | පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ග කොටසේ (A005) පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්වල නඩත්තු කටයුතු කොන්ත්‍රාත්කරු විසින් සිදුකර නොතිබුණු අතර, ඉහත වැඩවල නිවැරදිකිරීම් සහ නඩත්තු කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට රු.මිලියන 7.71 ක මුදලක් වැය වී තිබුණි. නමුත් එම වටිනාකම කොන්ත්‍රාත්තරුගෙන් අයකරගෙන මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවීමට ව්‍යාපෘතියට 2023 අප්‍රේල් 18 දින වන | එම වටිනාකම පියවීමට කොන්ත්‍රාත්කරු එකඟ වී ඇති අතර ඒ සඳහා වලංගු කාර්යය සාධන බැඳුම්කරයක් පවතී. ඉතිරි වැඩ ඉටු කිරීමට කොන්ත්‍රාත්කරුට මේ වන විටත් දැනුම් දී ඇති අතර, මේ සඳහා වලංගු රැඳවුම් මුදල් බැඳුම්කරයක් (Retention Money Bond) කොන්ත්‍රාත්කරු විසින් ලබාගෙන ඇත. | අමතර පිරිවැයකින් තොරව ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලගා කර ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

විටත් නොහැකි වී තිබුණි. තවද, 2022 අප්‍රේල් 18 දින වන විටත් ඉතිරි වැඩ සම්පූර්ණ කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී තිබුණි. කෙසේ වුවද, ඉතිරි වැඩ අවසන් කිරීමට ප්‍රථම අත්පත්කර ගැනීමේ සහතිකය නිකුත් කර තිබුණි.

**3.3 මතභේදාත්මක ගනුදෙනු**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල (අ.ස.ඔ.අ) සහ ශ්‍රී ලංකා රජය අතර 2012 ඔක්තෝබර් 08 දිනැති ගිවිසුම අනුව, සංරචක 02 ක් යටතේ සියයට 55 ක් අ.ස.ඔ.අ. මගින් මූල්‍යනය කර තිබුණි. ව්‍යාපෘතියේ අනෙක් සංරචකය දේශීය අරමුදලින් මූල්‍යනය කර තිබුණි. නමුත් 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 70.84 ක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මූල්‍යනය කර තිබුණු අතර වර්ෂ 08 කට වැඩි කාලයක සිට එය මූල්‍ය ප්‍රකාශනවල හිමිකම් යටතේ ඇතුලත් කර තිබුණි. තවද ඉහත මූල්‍යනය සඳහා වූ අනුමැතීන් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉඩම් අත්පත්කර ගැනීමේ හදිසි කාර්යයන් සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් මූල්‍ය පහසුකම් ලබාගෙන තිබුණු අතර, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හිමිකම් යටතේ පෙන්වනු ලැබේ. | වෙනත් මූල්‍යනයන් සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ රු.මිලියන 16.11 ක වන්දි මුදල් රේඛීය අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණු අතර, 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල එය හිමිකම් යටත් පෙන්වා තිබුණි. නමුත් මූල්‍යනය කිරීම් සඳහා වූ අනුමැතිය විගණනයට අනාවරණය නොවුණි. | ව්‍යාපෘතියේ මූලික අදියරේදී, එම මූලික වියදම් අදාල ව්‍යාපෘතියේ වැය විෂය යටතේ අමාත්‍යාංශය විසින් දරා තිබුණි. | වෙනත් මූල්‍ය ලබා ගැනීම සඳහා නිශ්චිත අනුමැතීන් ලබාගත යුතුය. |

**3.4 පද්ධති හා පාලනයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3.13 ක් වූ පොදු වියදම් (බදු කුලී, ජලය, පිරිසිදු කිරීම්) විවිධ විදේශ අධාර ව්‍යාපෘති අතර බෙදාහැරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී නිශ්චිත හා විශ්වාසදායක ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | විවිධ විදේශ අධාර ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කර ඇත. එම නිසා එක් එක් මාසයේ පවතින අග්‍රිම හා ප්‍රතිපාදනය සහ එක් එක් ව්‍යාපෘතියේ මුළු ව්‍යාපෘති පිරිවැය මත වටිනාකම ගලපනු ලැබේ. | සාධාරණ ක්‍රමවේදයක් යටතේ වියදම් බෙදාහැරිය යුතුය. |